මගේ අංකය : අධි.සේ.කො.ස./කොන්ත්‍රාත් බ.ගැ./2020

සියලුම
මහාධිකරණ විනිසුරුවරුන්,
සිවිල් අභියාචනා මහාධිකරණ විනිසුරුවරුන්,
දිසා විනිසුරුවරුන්,
මහේස්ත්‍රාත්වරුන්,
රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණය,
රෙජිස්ට්‍රාර්, අභියාචනාධිකරණය.

**විශ්‍රාමික උපලේඛනගත රජයේ නිලධරයන් නැවත සේවයේ යෙදවීම.**

අධිකරණවල දැනට කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගෙන සිටින විශ්‍රාමික උපලේඛනගත රජයේ නිලධරයන් ඔවුන්ගේ කොන්ත්‍රාත් සේවා කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් අධිකරණ සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. 2018.02.20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018, 2018.04.10 දිනැති අධිකරණ සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 416 සහ 2019.11.20 දින දරන අංක DMS/Policy/Recruitments භාණ්ඩාගාර චක්‍රලේඛය පිළිබඳව සළකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව විශ්‍රාමික කොන්ත්‍රාත් පදනම මත සේවය කරන නිලධරයන්ගේ සේවා කාලය දීර්ඝ කිරීමට ප්‍රතිපාදන නොමැති බව දන්වන ලෙස මා වෙත නියම කර ඇත.

02. ඒ අනුව අධිකරණවල කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදී සිටින විශ්‍රාමික නිලධරයන්ගේ සේවා කාලය අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් දැනටමත් ඔවුන් සේවයේ යොදවා ගැනීමට තීරණය කර ඇති සේවා කාලයෙන් පසු අවසන් කරන බව දන්වා සිටිමි. සේවා කාලය අවසන් වීමෙන් පසු එවැනි නිලධරයන් නැවත සේවයේ යොදවා ගැනීමට කටයුතු නොකරන මෙන් මෙයින් දන්වා සිටිමි.

එච්.එස්. සෝමරත්න,
ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2020 ජූලි මස 21 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදී ය.